# ස.ණ.ස.
# පුවත් කොළඹින්

2019 - අප්‍රේල් - හතරවන කලාපය

දායකත්වය රු 15/-











## සමුපකාර අරමුදලින් විදේශ පුහුණුව ලැබ සමුපකාර සංවර්ධනයට කර ඇත්තේ මොනවා ද?

සමුපකාර අරමුදලින් කෝටි 359 ක් 5% ගණනේ ණය දීම පිළිබඳව පෙබරවාරි කලාපයේ තොරතුරු වාර්තා කළෙමි. අරමුදල ශක්තිමත් වන්නේ සමුපකාර සමිතිවලින් උපයන අතිරික්තයෙන් වෙන් කරනු ලබන මුදලකිනි. 2015 වර්ෂයේ දී බස්නාහිර පළාතේ සමුපකාර අරමුදලට සණස සමිතිවලින් ලද දායකත්වය 43% ක් ඉක්මවයි. එහෙත් එවැනි දායකත්වයක් ඇති සණස සමිති සඳහා අරමුදලින් දෙන පහසුකම් ඉතාමත් අවමය. නැත්තටම නැති වා සේ ය. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කොළඹ කොට්ඨාශයට දී ඇති කෝටියක 5% හේ ණය කොළඹ දිසාවේ සණස සමිතිවලට ලබා ගැනීමේ වාසනාවක් නැත. අරමුදල ගැන තවදුරටත් ඔබගේ දැන ගැනීමට සැලැස්වීම සඳහා 2018 වර්ෂයේ දී අරමුදලින් වියදම් දරමින් ඉන්දියාවේ පුහුණු වැඩසටහන් සඳහා බස්නාහිර පළාත් සමුපකාර කොමසාරිස්වරයා විසින් 2,703,000/- ක් වියදම් දරා යවා ඇති පිරිස මෙසේ ය.

සමුපකාර හා මූල්‍ය ආයතන සංවර්ධනය සහ තොරතුරු තාක්ෂණය ක්‍රමවේද භාවිතය පිළිබද පුහුණු වැඩසටහන් දෙකකට, සමුපකාර හා ග්‍රාමීය ආයතන යහපාලනය පිලිබද පුහුණු වැඩසටහනකට 2018 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසවලදී සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් 4 දෙනෙකු දිස්ත්‍රික් නිලධාරීන් 5 දෙනෙක්, නීති නිලධාරිනිය, පරිපාලන නිලධාරීවරිය හා සමුපකාර සංවර්ධන නිලධාරීන් 17 ක් වශයෙන් සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලලත් අය පමණක් 28 දෙනෙකු ද ඒ අතරම කිතුල්වල, නාරාවිල හේනගම, හා නාවල කොස්වත්ත සණස සමිතිවල සභාපතිවරුන්ද, දූනගහ පොල්සමිතියේ ප්‍රවාහන කළමනාකරු ද, මුංවත්ත බටහිර බැංකු සමිතියේ ගණකාධිකාරී සහ හෝමාගම වි.සේ.ස සමිතියේ ලේකම් ද යවමින්, රුපියල් 27,03,000/- ක මුදලක් වැය කර ඇත.

කොමසාරිස්වරයා නිර්ලෝභීව වියදම් දරමින් පුහුණුව ලබාගත් පිරිසගෙන් සමුපකාර මූල්‍ය ආයතන සංවර්ධනයට, සමුපකාර ආයතනවල තොරතුරු තාක්ෂණය, හා සමුපකාර ග්‍රාමීය ආයතන යහපාලනය සඳහා සමුපකාර සමිතිවලට ඔවුන් මගපෙන්වීමක් කර ඇද්දැයිද යන්නවත් කොළඹ දිස්ත්‍රික් සංගමය වශයෙන් අප දැනුවත්ව නම් නැත.

සෑම සමිතියකම එක් අයකු වෙනුවෙන් ලක්ෂයක මුදලක් වැය කොට වර්ෂයකට එක් අයකු හෝ ලාභ ඉදිරියට ගෙනයාම වෙනුවට කිහිප දෙනෙකු හෝ ඉන්දියාවේ පුහුනුවට යැවිය යුතු බවට මම යෝජනා කරමි. එවැනි දැනුම්දීම් මා වෙත කලොත් පුහුණුව සංවිධානය කිරීමට කොළඹ සංගමයට හැකිය. අතිරික්ත අවම කර ගනිමින් සේවාවන් ප්‍රමුඛ කර ගැනීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය මතුවී ඇත. සමුපකාරය යනු සාධාරණයයි. සමුපකාරය සංවර්ධනය කළ යුත්තන් තුළවත් සාධාරණයක් නැත.

**සණස නායක ඩැනිසන් වීරසූරිය**

### අවුරුදු පැතුම

නැකත් පෙළයි, නව අවුරුදු කුමරු ගෙනෙන සිරියාවයි
කොහත් හඩයි එරබදු මල් පොකුරු නැමෙන පරිසරයි
බුලත් අතයි මුං තල, කජු කිරිබත දෙන සුවඳ හමයයි
කිරිත් පිරෙයි උතුරන්නට, සණස ඔබට අසිරි පතයි

පබඳුම - හේමසිරි බෙනරගම

## 30 වන සංවත්සරයට
## පියනැගූ වගයි



හෝමාගම මහකටුවාන ගලවිලවත්ත සණස සමිතියේ 30 වන සංවත්සර උත්සවය පසුගියදා සමිති උත්සව ශාලාවේදී පවත්වන ලදී. එදින ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි වු කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ සාමාන්‍යාධිකාරි තුසිත් කුමාර විරවර්ධන මහතා අදහස් දක්වමින් සමුපකාර ගීතයේ කියවෙන මූලික සිද්ධාන්ත පැහැදිලි කරන ලද අතර, පළමු කොටසින් සමුපකාර ව්‍යවසායද, දෙවන කොටසින් සමානාත්මතාවද, තෙවන කොටසින් ආර්ථික සංවර්ධනයද, සිව්වන කොටසින් දේශාභිමානයද, පස්වන කොටසින් සංවර්ධිත රටක් බිහිවීමද යන කරුණු පැහැදිලි කල අතර එම ගීතයේ සදහන් පදවැලෙන් දිළිදු දනා, අසරණයා දුකින් මුදා යන පද ඉවත්වනවා නම් වඩා හොඳ බව පැවසීය. අවසාන වශයෙන් අධ්‍යක්‍ෂක මණ්ඩලය කාර්යක්‍ෂමව සියළු කටයුතු අවංක හා කැපවීමෙන් කිරීම සතුටට කාරණයක් බව පවසමින් ඔහුගේ කථාව අවසන් කරන ලදී.

කලාප අධ්‍යක්‍ෂක ප්‍රසන්න කුමාර ගීගනගේ මහතා අදහස් දක්වමින් සභාපතිතුමා පුරුදු පුහුණු පාඨමාලා හදාරා කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ හෝමාගම කලාපයේ අධ්‍යක්‍ෂක වශයෙන් කටයුතු කර ඇති බවත් සමිතියේ දියුණුවට විශාල මෙහෙවරක් කර ඇති බවත් පැවසීය.

07 පිටුවට...

## 2019 අවුරුදු චාරිත්‍ර




### නව සඳ බැලීම

අභිනව චන්ද්‍ර වර්ෂය සඳහා 2019 ක් වු අප්‍රේල් මස 07 වෙනි ඉරිදා ද අභිනව සූර්ය වර්ෂය සඳහා මැයි මස 09 වෙනි බ්‍රහස්පතින්දා දිනය සඳබැලීම මැනවි.

### පරණ අවුරුද්ද සඳහා ස්නානයට

අප්‍රේල් මස 13 වෙනි සෙනසුරාදා දින නුග පත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කොට ඉෂ්ට දේවතා අනුස්මරණයෙහි යෙදීම මැනවි.

### අලුත් අවුරුදු උදාව

අප්‍රේල් මස 14 වෙනි ඉරිදා අපරභාග 02.09ට සිංහල අලුත් අවුරුද්ද උදාවෙයි.

### පුණ්‍යකාලය

අප්‍රේල් මස 14 වෙනි ඉරිදා පූර්වභාග 07.45 සිට එමදා අපරභාග 08.33 දක්වා පුණ්‍ය කාලය බැවිස් අප්‍රේල් මස 14 වෙනි ඉරිදා පූර්ව භාග 07.45 ට පළමුව ආහාරපාන ගෙන සියලු වැඩ අත්හැර ආගමික වතාවත් වල යෙදීමද, පුණ්‍යකාලයේ අපර කොටස තුල එනම් අප්‍රේල් 14 වෙනි ඉරිදා අපරභාග 02.09 සිට අපරභාග 08.33 දක්වා පහත දැක්වෙන අයුරින් වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදී අවුරුදු චාරිත්‍ර විධි ඉටුකිරීම ද මැනවි.

### ආහාර පිසීම

අප්‍රේල් මස 14 වෙනි ඉරිදා අපරභාග 02.42 ට රතු කහ මිශ්‍ර (තඹ පැහැති) වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා ලිප් බැද ගිණි මොළවා හකුරු මිශ්‍ර කිරි බතක් ද තිකුළු මිශ්‍ර අග්ගලා සහ කැවුම් වර්ගයක් ද පිළියෙල කර ගැනීම මැනවි.

### වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම, හා ආහාර අනුභවය

අප්‍රේල් මස 14 වෙනි ඉරිදා අපරභාග 03.54 ට රතු කහ මිශ්‍ර (තඹ පැහැති) වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා සියලු වැඩ අල්ලා ගණුදෙනු කොට ආහාර අනුභවය මැනවි.

### හිස තෙල් ගෑම

අප්‍රේල් මස 17 වෙනි බදාදා පූර්වභාග 07.40ට නැගෙනහිර දිශාව බලා හිසට කොහොඹ පත්ද, පයට කොලොන් පත්ද, තඹා පලාවන් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී කොහොඹ පත් යුෂ නානුද ගා ස්නානය කිරීම මැනවි.

### රැකීරක්‍ෂා සදහා පිටත්ව යෑම

අප්‍රේල් මස 18 වෙනි බ්‍රහස්පතින්දා දින පළාවන් පැහැති වර්ෂ වස්ත්‍රාභරණයෙන් සැරසී හකුරු හා තල මිශ්‍ර කිරිබත් අනුභව කොට පූර්වභාග 04.52ට නැගෙනහිර දිශාව බලා පිටත්වීම මැනවි.

# සිරුරේ ආරක්ෂාවට යමක්...

සමාජගත වීමෙන් පසු සෑම මිනිස් ජීවියෙකුට වගකීම් පිළිබඳව වගවීමට කරුණු සැළසේ. එම හේතුව නිසාම එක්සත් ජාතීන් හා කම්කරු සංවිධාන එක්ව, මිනිසා 'වැඩ කිරීමේදී ආරක්ෂාවීම හා සෞඛ්‍යය' පිළිබදව වසරකින් දිනයක් වෙන්කර දී ක්‍රියා කිරීමට මතකය අවදි කිරීමට අවස්ථාව සළසා ඇත.

එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථා වලදී ඔබටද විවිධ ක්‍රියාකාරකම් වල නිරත වීමට සිදුවේ. මේ නිසාම සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය මුල්කර පළමු ශ්‍රේණිවල දරුවන් සදහා මග පෙන්වීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශන අංශයෙන් පොත් නිර්මාණය කර විස්තර සහිතව ක්‍රියාකාරකම් වල යෙදීමට ද උපදෙස් ලබාදී තිබේ.

නිරන්තරයෙන් වෙනස්වන සමාජයක විවිධ සමාජ ප්‍රවාහයන්ට සාර්ථකව මුහුණ දීමට සුදානම් වීම අවශ්‍යය. ඊට දැනුම හා අවබෝධය ප්‍රවර්ධනය කිරීමට පෙළ පොතකින් හෝ අදහස් ලබාදීම ජීවිත ආරක්ෂාවට මහත් ඵලදායිවේ. පවුලක පැවැත්මට සේම රටේ සංවර්ධනයට ද ආරක්ෂාවීම හා තම සෞඛ්‍යය ගැන සිතීම වැදගත්ය. ජීවීන්ගේ විවිධ භෞතවේදීය ක්‍රියාවලි එකිනෙක හා බැඳී පවතී. සෑම මිනිසෙකුම ජීවත් වීමට ආහාර ලබාගත යුතුය. ආහාර අවශෝෂණය වී සිරුර පුරා රුධිරය මගින් බෙදා නොහැරීමෙන්ද, ඔක්සිජන් සැපයීම සිදු නොවීමෙන් අනර්තයන් සිදු නොවේ යැයි කාට නම් කිව හැකිද?

ශරීරයක සමායෝජනයේ දියුණුව අනුව චලනයන්ගේ විවිධත්වයන් ඇතිවේ. එනිසාම අප විමසීමෙන්, අවබෝධයෙන් ආරක්ෂිතව සිටිමින් තම සෞඛ්‍යය පවත්වා ගැනීම ඔබේ වගකීමයි. තවත් කෙනෙකුට ඔබ සදහා බලෙන් ලබා දියහැකි තත්වයක් නොවේ. සංචරණයේදී එක් පේශී කාණ්ඩයක් හැකිලෙන අතර තවත් කාණ්ඩයක් දිග හැරේ. එනිසා සැලකිලිමත් වීම වැදගත්ය. පේශී ගැන නොසිතා සිරුර අප්‍රාණික කර ගැනීමට ඔබ කැමතිද?

වෙහෙසකාරී ක්‍රියාවකින් පසු හුස්ම ගැනීම වේගවත්වේ. හෘද ස්පන්දනයද වේගවත් වේ. මේ නිසා ඔක්සිජනය සහිත රුධිරය වැඩි ප්‍රමාණයක් පේශි වලට මුදා හැරේ. වැඩි කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණ පිටවේ. මෙම ක්‍රියාවලිය අපි නොසිතාම සිදුවන බැවින් චලන අවස්ථා පිළිබඳව අවබෝධය තිබිය යුතුමය. දෑත සම්බන්ධ කර බරක් එසවීමේදී කොන්දට බර නොදී, දනිස් දෙකට බර ලබාදීමෙන් සිරුරට ආරක්ෂාව සැලසේ. උරහිස මතට බරක් ගැනීමේදීද, පැත්තට හැරී බරක් එසවීමේදිද සැලකිලිමත්වීම අවශ්‍යයි.

එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් පමණක් නොව ඔබ යම්කිස් සේවයක යෙදීමේදී ආරක්ෂාවීමට ආරක්ෂිත උපකරණ අනිවාර්යෙන්ම සපයා ගෙන පැළදිය යුතුය. උදාහරණ වශයෙන් පෑස්සුම් කටයුත්තකදී දෙනෙත ආරක්ෂාවට නියමිත කණ්නාඩිය පැළදීම. දැති රෝද සහිත ලී ඉරන ස්ථානවල සේවයේ යෙදෙන්නා ආවරණ සහිත උපකරණ භාවිතය, විදුලිය හා සම්බන්ධ ක්‍රියාවකට පෙර ප්‍රධාන ස්විචය ක්‍රියා විරහිත කොට රැහැන් කටයුතු කිරීම. වාහනයක් පැදවීමේදී ආසන පටි පැළදීම සිදුකළ යුතුය.

සෑම වසරකම අප්‍රේල් 28 දින 'වැඩකිරීමේදී ආරක්ෂාවීම හා සෞඛ්‍යය' පිළිබඳව මතකයට නැංවීම සඳහා වෙන්කර දී වැඩසටහන් පැවැත්වීමෙන්, සමුපකාරිකයෙක් වු ඔබටද ජීවිත පැවැත්ම සදහා කොටස්කරුවෙකු වීමට වගබලා ගැනීම යුතුකමකි.

## ස.ණ.ස. පුවත් කොළඹින්

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
තුසිත් කුමාර වීරවර්ධන

☆ **ප්‍රකාශන කමිටුව**
කේ. ඩී. පතිරත්න
හේමසිරි බෙනරගම
සුනිල් අබේසුන්දර
එම්.රොහාන් ජේ. පෙරේරා
එම්.ඩී. ජිනදාස

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
**දු.ක. 0112 851213, 0112 848801, 0114 301228**
sanasacolombo@gmail.lk

**ගුණාත්මක ණය කලඹක් ගොඩනංවා ගැනීමට නම්**

# කල්පසු ණය පාලනය කරන්න



අප මූල්‍ය ආයතන ලෙස ලබා දී ඇති ණය කල්පසුවු විට එහි වරද පටවනු ලබන්නේ ණය ලබාගත් සාමාජිකයාටයි. නමුත් එය එතරම් සාධාරණ නොවේ. ඔහු හෝ ඇයද වගකිව යුතුය. නමුත් කල්පසුවු ණය අවම මට්ටමකින් පවත්වා ගෙනයාම සඳහා සමිති නිලධාරීන්ගේ වගකීම කුමක්ද? යන්න විමසා බලමු.

මුලින්ම කල්පසුවීම යනු කුමක්දැයි විමසා බලමු. 'යම්කිසි ක්‍රියාවක් හෝ සිදුවීමක් නියමිත වේලාවට හෝ දිනයට සිදුනොවීම කල්පසුවීමක් ලෙස හැදින්වෙයි. එසේනම්, ණය කල්පසුවීමක් යනුවෙන් හැදින්වෙන්නේ යම්කිසි ආයතනයකින් ලබාගත් ණය මුදලක් සඳහා ගෙවියයුතු වාරිකය, ආපසු ගෙවීම නියමිත දිනට සිදුනොවීමයි.

ණය කළමණාකරණයට අනුව යම්කිසි පුද්ගලයෙකුගේ ණය වාරිකයක් ගෙවා නැත්නම්, එකී පුද්ගලයාගේ මුළු ණය ශේෂයම අවදානම් ණයක් ලෙස සලකනු ලබයි. එසේම ලැබිය යුතු ණය වාරිකයෙන් කොටසක් ගෙව්වද, එකී පුද්ගලයාගේ මුළු ණය ශේෂයම අවදානමට ලක්වෙයි. නිර්වචනය මෙසේ උවුද සමිති ණය කළමණාකරණය තුල මෙම නිර්වචනය තරමක් දුරට ලිහිල්කර ඇත. නමුත් ඕනෑම ණයක් කල්පසුවු විට එහි ඇති අවදානම බැහැර කල නොහැකිය. ණය කල්පසුවීම සහ ආපසු ගෙවීමේ රටාව නිසියාකාරව හදුනා නොගත්තොත්, 'කිසිවෙකු නොදැනීම ආයතනික වත්කම් දියවීයාම සිදුවන අතර අවසානයේදී ආයතනය වැසීයාම පවා සිදුවිය හැකිය.

නමුත් එසේ වීමට පෙර ණය කල්පසු වීම හේතුවෙන් සමිතියක් තුල ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල රාශියක් ඇත. ඒවා කෙටියෙන් විමසා බලමු.

1. **අදාල කාලය තුල ලැබිය යුතු පොලී ආදායම ප්‍රමාදවීම හා බලාපොරොත්තු වුවාට වඩා අඩුවීම.**
   මේ නිසා සමිතියේ ආදායම් ලැබීමේ ගැටළු මතුවීමට පටන් ගනී. එසේ ආදායම අඩුවීම හේතුවෙන් වත්කම් වර්ධනයට තිබෙන අවස්ථාවන් නොලැබීයයි. එපමණක් නොව සමිතියේ වියදම් පාලනය ද නිසියාකාරව පවත්වා ගැනීමට නොහැකිවීම තුලින් අලාභ තත්වයන්ට මුහුණ දීමට සිදුවෙයි.
2. **ණය වාරිකය කල්පසුවීම මත මුදල් ප්‍රවාහයේ අපේක්ෂිත මුදල් ගලා ඒම අඩුවීම නිසා ද්‍රවශීලතා ගැටළු මතු වීම.**
   මෙය ඉතා අහිතකර තත්වයකි. මින් ඇතිවන තවත් සංකීර්ණ ගැටළු රාශියකි. එනම් නැවත ණය ලබාදීමටත්, තැන්පතු නිදහස් කිරීමටත් අවශ්‍ය තරම් ද්‍රවශීලතාවය නැතිවීම මත අධික පොලියට බාහිරින් අරමුදල් රැස්කිරීමට සිදුවීම. මේ හේතුවෙන් සමිතිය තුල වත්කම් ඉක්මවා වගකීම් අධික වීමෙන් බුන්වත්භාවයට පත්වීම.
3. **ණය ලාභීන් ප්‍රමාණය ක්‍රමිකව අඩුවීම.**
   කල්පසුවු ණය ලාභීන්ට නැවත ණය ලබාදිය නොහැකිය. එසේම නිවැරදිව තීරණ ක්‍රියාත්මක වනවානම් ඔවුන්ගේ ඇපකරුවන්ටද ණය ලබාදිය නොහැකිය. එවිට සමිතියේ ගනුදෙනුකරුවන්ට සිදුවන්නේ කුමක්ද? ඔවුන් සමිතියට පැමිණීම දිනෙන් දින අඩුකරයි. සමිතියේ බල ප්‍රදේශයද පුළුල් නොවන විට සාමාජිකත්වයට කුමක් සිදුවෙයිද?
4. **කල්පසු වු ණය වැඩිවීමත් සමග බොල් ණය වෙන්කිරීමද ක්‍රමක් ක්‍රමයෙන් වැඩිවෙයි.**
   මෙවිට සිදුවන්නේ කුමක්ද? සමිතියේ ලාභ අලාභ ගිණුමත්, ශේෂ පත්‍රයත් විකෘති භාවයට පත්වේ. දිගන් දිගටම අලාභ ලැබීමටත්, වත්කම්වල ඉපයීමේ ශක්තියත් අඩුවීමට පටන් ගනී. එය සෘජුවම ණය හා තැන්පතු පොලී ප්‍රතිශත වලට ඉතා අහිතකර ලෙස බලපායි. මෙය අවධිමත් මූල්‍ය කලමණාකරනයක් ලෙස බාහිර ලෝකයට පෙන්නුම් වීමෙන් සමිතියේ මූල්‍ය විශ්වාසය පළුදු වෙයි.
5. **කල් පුසු වු ණය ඉතා විශාල ලෙස වැඩිවත්ම ණය කපාහැරීමට සිදුවිය හැකිය.**
   නමුත් මෙය විධිමත් මූල්‍ය කලමණාකරනයක් නොවේ. මේ තුලින් ආයතනයේ වත්කම් කපාහැරීමක් සිදුවන අතර, එය ශේෂ පත්‍රයට සෘජුවම බලපායි. මේ තුලින් ආයතනයේ මූල්‍ය හා කලමණාකරන ශක්තිය පිලිබඳව දුර්වල ප්‍රතිරූපයක් ඇතිවෙයි.
6. **සේවක අභිප්‍රේරණය හා සමාජ සුභසාධනය සිදුකිරීමට නොහැකිවීම.**
   කල්පසුවු ණය වල ප්‍රතිඵලයක් ලෙස සමිතියේ වියදම් අධික වී අලාභ ලබන හෙයින් සේවකයින්ගේ වැටුප් සහ දිරි දීමනා ආදිය වැඩිකිරීමට නොහැකිවෙයි. එසේම සමාජ සුභ සාධනය කල නොහැකි වීමෙන් සාමාජික අප්‍රසාදය ඇතිවෙයි. මේ තුලින් සමිතිය දිනෙන් දින පිරිහීමට ලක්වෙයි.
7. **ඉහත තත්වය වර්ධනය වනවිට සමිතියේ සිටින හොද ණය ලාභීන්ද සිය ගෙවීම් පමාකිරීමට උත්සාහ කරයි.**
   එසේම තැන්පතු කිරීමද අඩුවීම හෝ නතර කිරීම සිදුවෙයි. මෙය දිගින් දිගටම සිදුවීම තුලින් සමිතියේ අරමුණු කරා ලගාවීමට නොහැකිවෙයි. එසේම මෙම කල්පසුවු ණය තුලින් සෑම දිනකම අමතර පිරිවැයක් සමිතියට එකතු වෙයි. මෙය ඔබට නොදැනීම සිදුවෙයි. මෙයට හොදම උදාහරණය මුහුද මැද තිබෙන අයිස් කන්දක් ගැන සිතන්න. මෙය දිනෙන් දින යටින් දිය වී යයි. එවිට යම්කිසි දිනක උඩ කොටස නොපෙනි යයි. මේ ආකාරයට යම් කිසි දිනක සමස්ථ සමිතියම විනාශ වී යාමට පුළුවන.

එසේනම් මින් අප සමිතිය බේරාගන්නේ කෙසේද? ඒ සඳහා පලමුව සිදුකල යුතු වන්නේ සමස්ථ කාරක සභාවත්, සියළුම සේවක මණ්ඩලයත් තම සමිතියේ ණය කල්පසු වීම සහ ආපසු ගෙවීමේ රටාව නිසියාකාරවත්, විද්‍යානුකූලවත් හදුනාගැනීම සිදුකල යුතුය. ඉන්පසු ඒ සඳහා සිදුකල යුතු ආරක්ෂණ ක්‍රමවේද කිහිපයක්ම පවතියි. ඉදිරිකාල වලදී එම ක්‍රමවේද පිලිබඳව කතාකරමු.

**තුසිත් කුමාර වීරවර්ධන - සාමාන්‍යාධිකාරී කොළඹ දිස්ත්‍රික් සණස සංගමය**

ස.ණ.ස.
පුවත් කොළඹින්

2019 අප්‍රේල් කලාපය
03 පිටුව

# 76 සැමරූ

## උන්දුරුගොඩ සමිතිය

දිසා සංගමයේ අංක 5 සාමාජිකත්වය උසුලන උන්දුරුගොඩ සමිතියේ 76 වන සංවත්සරික මහා සභාව පසුගියදා එම සමිති ශාලාවේදී විශාල සමුපකාරිකයින් පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

1981 වසරේ සිට මේ දක්වා සමිතියේ සහභාගිත්වය උසුලන කේ.කේ. වීරක්කොඩි මහතා, මෙවරද ඉදිරි වර්ෂය සඳහා නිතරගයෙන් තේරී පත්වන ලදී.

මේ අවස්ථාව සඳහා කැස්බෑව කලාප ගරු මාකන්දන පර්ෂද සභාපති ෂෙල්ටන් සේනාරත්න, මත්තේගොඩ පර්ෂද අධ්‍යක්ෂ සී. ගමගේ මහතාද, සභාපති ගුණසීලි මාලනී පීරිස් සමගින් තවත් විශාල පිරිසක් සහභාගි වූහ.



එම්. රොහාන් ජේ. පෙරේරා - ප්‍රකාශන කමිටු නියෝජිත

# සමුපකාර ක්‍රමය දිළිඳු ජනතාවගේ සහ වරප්‍රසාද නොමැති අයවෙනුවෙනි.

කොළඹ දිස්ත්‍රික් සංගමයේ සාමාජිකත්වය ලබා ඇති සණස සමිතිවල 2019 වසරේදී ඉදිරිගමන ගැන දැනුවත් කිරීමට, පැවති රැස්වීමේදී,

සමුපකාර ප්‍රසාදිනී, ගරු සභාපති ඩෙනිසන් වීරසූරිය මහත්මා තමන් නායකත්වය ලබන සමිතිය තුල දැනුම ලබාගැනීමට පැමිණිම ගැන තුතිවන්න වනබව පවසමින්

දිස්ත්‍රික් සංගමය මගින් ක්‍රියාත්මක වන සමිති වලින් අක්‍රීය සමිත 15ක්ද සාර්ථක සමිති 175ක් පමණ තිබෙනා බවද, දැන ඉගෙන කටයුතු කරන්නේ නම්, හොඳ සේවයක් කලහැකි බවත්, පර්ෂදයේදී සාමාජික අත්දැකීම් හුවමාරු කර, අන් අයට කරුණු පැහැදිලි කළ යුතු බවත් පැවසීය.

සාමාජිකයෙකු විසින් එක් අයෙක් බැන්දවීම, කාරක සභිකයන් මගින් සාමාජිකයන් 5-10ත් බැන්දවීම, ප්‍රබෝධන වැඩසටහන්, අත්පත්‍රිකා බෙදා හැරීම, කණ්ඩායම් මගින් ගොස් දැනුවත් කිරීම, පර්ෂදය තුලම සාමාජික වර්ධනය ඇතිකල හැක. සමුපකාර ක්‍රමය යනු වැඩිදෙනාගේ අදහස් උදහස් දැන ගැනීමයි. පර්ෂදය අධ්‍යාපන මණ්ඩපයක්, අත්දැකීම් හුවමාරු කරගැනීමට, හැකි අයෙක් ඇත්නම්, එමකෙනා සුදුසු බව, දැනුම සමිතිවලට භාවිතා කිරීම එතුමාර කරන ගෞරවයක් බව පැවසුවේය.

නායකත්වය පිළිබඳ අවශ්‍ය කුසලතා දැනුවත් කිරීම කලයුතු බව,

දුෂ්කරතා පිළිබඳව පර්ෂදය තුල ක්‍රියාත්මක විය යුතුයි

පර්ෂදවල ළමා සාමාජික වර්ධනයට ගතහැකි ක්‍රියාමාර්ග

ත්‍යාග ලබාදීම නොමිලේ අධ්‍යාපන චාරිකා සංවිධානය

පාසැල් උපකරණ ලබා ගැනීමට පොලී රහිතව ණය ලබාදීම

සාහිත්‍ය තරඟ සංවිධානය කිරීම, විවිධ ප්‍රසංග පැවැත්වීම

පර්ෂදය තුල තැන්පත් වර්ධනය කරගැනීමේ හැකියාව සහ නැතිවීමට හේතු දැනගත යුතුයි. සෑම මහසභාවකම විනාඩි 15 ක් වත් දැනුවත් කිරීම කලයුතුවේ. මෙය සුවිශේෂි ජීවන ක්‍රමයකි.

නිර්ණායක වලට වඩා වැදගත් වන්නේ, ගෙවීමේ හැකියාවේ සහ අවශ්‍ය ණය අතපසු ප්‍රතිශතයක් ලෙස 5% ක් වේ නම් හොඳ බවයි.

පර්ෂද 32 ක නායකයින් 32 ක් ඇත. පර්ෂදයේ දුර්වල සමිතියක් වේ නම්, එම පර්ෂද නායකත්වයේ හිඩැසක් ඇති බව, පර්ෂදයට සහභාගිවන්නන්ගෙන් විමසා බැලීම, පර්ෂදයට සම්බන්ධීකරන ලේකම්වරුන් මැදිහත් කර ගැනීම, කාර්යඵල ඇගයීමේදී අනිවාර්යෙන්ම සමිති උසස් බවට පත්වේ. සමිතිතුල ණය අතපසු, යුතුකම් හා වගකීම්, සුභ සාධක කටයුතු පිළිබදව දැනුවත් අය සිටිනම්, විවිධ මාතෘකාතුල කතාකල හැකි අයගේ ලේඛණයක් සකස් කර ගත හැක.

සමිති සාර්ථකවීමට නම්, මාස තුනකට පෙර අස්තමේන්තු සකස් කිරීම, ඉලක්ක සපුරා ගැනීම කලයුතුයැයි. පර්ෂද වැදගත් ලෙස කටයුතු කරන්නේ නම්, හොද බව සමිති ආරම්භයේදී සිට දී ඇති ණය සම්පත් ප්‍රගත් වාර්තාවට ඇතුලත් විය යුතුයි.

ප්‍රේමලතා වනිගසේකර - මධ්‍යම කාන්තා කමිටු ලේකම්

# 20 වන සංවත්සර සැමරුම



උද්‍යාන සණස 'රන් කැකුළු' ළමා සමිතියේ 20 වන සංවත්සර උළෙල පසුගියදා සමිති ශාලාවේදී උත්සවාකාරයෙන් පවත්වන්නට යෙදුණි.

අධ්‍යාපන කමිටුවේ පූර්ණ මෙහෙයවීම යටතේ අදවන විට ඉතාම සාර්ථකතත්වයක් ලබා ඇති ළමා කමිටුව දරුදැරියන්ගේ දැඩි උද්යෝගය සහ උනන්දුව මත ඉදිරියට ගරගෙන යෑමට ගරු සභාපතිතුමා ඇතුළු කාරක සභාව නොමද සහයක් ලබාදෙයි. ඉතා අලංකාර නැටුම් - ගැයුම් වලින් පිරි උත්සවය කාගේත් පැසසුමට ලක්විය. පැමිණීමේ ත්‍යාග සහ නොයෙකුත් කුසලතා දැක්වූ ළමුන් සඳහා ත්‍යාග පිරිනමන ලදී.

<u>නව වර්ෂය සඳහා තේරී පත්වූ නිළධාරී මණ්ඩලය</u>

| | |
|---|---|
| සභාපති | : එම්.එම්. දැහිමි ස්වේතා |
| උපසභාපති | : පවනි රන්දිමා |
| ලේකම් | : චරිත් මනුල ජයමාන්න |
| උපලේකම් | : ඒ.කේ.ඩී. දුලීෂා නෙත්මි පෙරේරා |

## සිරි අසිරි මැද

# අවුරුදු ආවා

කුහු.. කුහු.. හිම්දිරියේ කොහා හඬන්නේ
එරබදු මල් පොකුරු පිපී සිරිය ගෙනෙන්නේ
ගම්මැද්දේ නිවෙස් හැමගෙ කලඑළි වන්නේ
අසුවනු වී බිස්ස තුළින් සුවඳ හමන්නේ

වත්ත පහල ඔන්චිල්ලා බැද නැලවෙන්නේ
ගමේ ළඳුන් ගම් මැන්දේ රබන් වයන්නේ
බුලත් අතයි දෝත පුරා හැමගෙ තියෙන්නේ
වැඩිහිටි ගුරු දෙගුරු නැමැද අසිරි පතන්නේ

කැවුම් ගෙඩිය, කොකිස් මලයි තෙලේ වැටෙන්නේ
අතරස පැණි වළලු අතර පැණි බේරෙන්නේ
කිරිබත් පැණි පොල් සිඹිමින් සුවඳ බලන්නේ
කෙසෙල් කැනක් කහ පාටින් ගෙයි හිනැහෙන්නේ

ළමා ලපටි උජාරුවෙන් දුව පැන යන්නේ
ගැටිස්සියන් කොක් හඬ දී සිනා පලන්නේ
අම්මාවරු මුළුතැන් ගෙය පිරිබඩ ලන්නේ
අත්තම්මා කම්බායේ හැඩය කියන්නේ

ගිණි මොලවන නැකත ලබා වෙඩිහඬ එන්නේ
පිරුනු සිතින් හිනා වෙමින් පන්සල් යන්නේ
අළුත් ඇඳුම්, රස කැවිලිද අතිනත යන්නේ
අවුරුදු කුමරා හැමටම සෙත් ගෙන දෙන්නේ

පබඳුම - හේමසිරි බෙනරගම

# අඛණ්ඩව 17 වන වරටත් අකරවිට සණස චාරිකාව

නාමල් අරණ විහාරය, කින්නියා උනු ලිං, අරුගම් වෙහෙර විහාරස්ථානය නරඹන ලදී. කෝනේශ්වරන් විහාරය සහ කෝවිල වැදපුදා ගන්නා ලදී.

දෙවන දින සේරුවාවිල විහාරස්ථානය සහ ලංකා පටුන විහාරය වැදපුදා ගැනීමෙන් පසු නිලාවේලි මුහුදුතීරයේ නරඹා පැමිණි ලදී.

මෙම වාර්ෂික චාරිකාව සඳහා බස්රථ 04ක් යොදාගත් අතර 216 දෙනෙක් මෙම වන්දනා චාරිකාවට සහභාගි වූහ. මේ සඳහා වූ සියලු වියදම් සමිතියේ අරමුදලින් යොදවන ලදී.



ටී. විජේවර්ධන - සභාපති

# සණසට තුති

අරබා සණස තිස්වසරක් තිස්සේ
දින දින ගියේ දියුනට නැහැ පසු බැස්සේ
කරදර කම් කටලු මැද කාලෙක තිස්සේ
අද මම ගියා සණසට කලකට පස්සේ

බැංකු පොතේ අකුරුත් මගෙ මැකී ඇත
සමිතියෙ දියුන දැක තුටුවුනි මගේ සිත
සමිතිය සණස මම අමතක කලේ නැත
කල ඇරයුමට එන්නට තුති පුදමි මින

නිවහන සණස මගේ ගමතුල තිබෙන ලැසී
සාමාජික පිරිස් ඇත මෙහි සතර දිසී
යයි පෙරමුනට මෙහි බාධක නොමැත කිසී
කැළණිය, කොමලි මේ අසලින් ගලා බසී

සක්‍රිය කරන්නට සමිතියෙ නිලධාරී වෙහෙස වුනි
වෙහෙසුන සැමට තුති පුද දෙමි හදට දැනී
කහටපිටිය ගමෙ දියුනුව පතන්නෙමි
බාධා මැඩදමා හැම හා පෙරට යමි

ලීලා බුලත්ගම - කහටපිටිය සණස

# ප්‍රජාතන්ත්‍රවාදයේ නිදහස

සමුපකාර ප්‍රතිපත්ති හතක් ඇති බව අපි දනිමු. එම ප්‍රතිපත්ති අතර දෙවන අංකයේ ලාගැනෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයයි. සාමාජිකයින් විසින් තෝරාපත්කර ගන්නා නිලධාරීන් ලෙස සලකන කුඩා පිරිස සාමාජිකත්වයට වගකිව යුතුවේ. ප්‍රාථමික සමුපකාර සමිතිවල සාමාජිකයින්ට එක හා සමාන ඡන්ද බලයක් ඇත. මෙම ඡන්දය දීම සඳහා නිදහසක් තිබිය යුතුය.

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රම නොයෙක් රටවල නොයෙක් ස්වරූපයෙන් ක්‍රියාත්මක වුවත්, මූලික වශයෙන් නිදහස් උරුම කීපයක් ප්‍රජාවට තිබිය යුතුය. එහෙත් බලාපොරොත්තුවන සියලු නිදහස නොලැබීමෙන් මිනිසාට ලැබිය යුතු සතුට ගිලිහී ගොස් ඇත. නීති රීති මිනිසා විසින්ම අනුමත කර සමාජ පැවැත්ම සඳහා ක්‍රියාත්මක වේ. නීතියක් මිනිසාගේ යහපතට මෙන්ම දියුණුවට අදාල විය යුතුවේ. උදාහරණ ලෙස දැක්වීමේදී මිනීමැරීම තහනම, රථවාහන වම්පසින් පාරේ ගමන් කරවීම, සොරකම් කිරීමට දඩුවම් දීම, බාල වයස්කාර දරුවන් රැකියාවේ යෙදවීම, අඹු සැමියන් ලෙස ජීවත්වීමට විවාහ සහතිකයක් ලබා ගැනීම ඒවා අතර ප්‍රධාන වේ.

ප්‍රජාවගේ අවශ්‍යතාවයන් සඳහා සමිති සමාගම් බිහිකර ඒවා හී නියැලි ප්‍රයෝජන ගැනීම ප්‍රජාතන්ත්‍රවාදයෙන් ලත් නිදහසකි. නීතියට අවනත විය යුත්තේ එකඟවීමෙනි. එසේ නොවන්නේ නම් ප්‍රජාතන්ත්‍ර අයිතිය එතැන නැත. රජයක මෙන්ම සංවිධානයක පරමාර්ථ අතර තිබිය යුත්තේ, ජනතාවගේ සාමාජිකයාගේ යහපත හා ප්‍රීතිය ලබාදීමය. එය ලබා දීමට උනන්දුව, දක්ෂතාවය, ස්වයං හැකියාව දියුණුකර ගැනීමට නිදහසක් තිබිය යුතුය.

ආගමක් පිළිගෙන ඇදහීමට හෝ අනුගමනය කිරීමට ප්‍රජාතන්ත්‍රවාදයෙන් නිදහසක් ඇතිවේ. එසේම ජනතාවගේ පරම අයිතිය තම සිතැඟි පරිදි මෙහෙයවා රට පාලනය කිරීමට මෙන්ම සංවිධානයක් පවත්වාගෙන යාමට සුදුස්සන් තෝරා පත් කර ගැනීමට නිදහසක් තිබිය යුතුවේ.

ආගමක් පිළිගෙන ඇදහීමට හෝ අනුගමනය කිරීමට ප්‍රජාතන්ත්‍රවාදයෙන් නිදහසක් ඇතිවේ. එසේම ජනතාවගේ පරම අයිතිය තම සිතැඟි පරිදි මෙහෙයවා රට පාලනය කිරීමට මෙන්ම සංවිධානයක් පවත්වාගෙන යාමට සුදුස්සන් තෝරා පත් කර ගැනීමට නිදහසක් තිබිය යුතුවේ. දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදීව පවත්වා ගෙන ජනතාවගේ සුභ සිද්ධිය සඳහා මෙන්ම ආරක්ෂාව උදෙසා ලබා දීම අත්‍යාවශ්‍ය වේ. අදහස් බලයෙන් කෙනෙකුට ආරෝපනය කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවකි.

පෞද්ගලික මෙන්ම ආගමික,දේශපාලන නිදහසක් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ඇති වෙනවා සේම ආර්ථික නිදහසද තහවුරු විය යුතුය. සමානාත්මතාව තුළින් සමුපකාරයේ තෙවෙනි ප්‍රතිපත්තිය විදහා දැක්වේ. සමිතියක් තුල ඇති ප්‍රාග්ධනය පොදු අයිතියකි. සාමාජිකයා විසින් සමිතියට යොදවන මුදල් සඳහා යම් පොළී ප්‍රතිශතයක් ගෙවීමද සිදුකෙරේ. මෙම කරුනු අතර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය අනුගමනය කිරීම මත එක සමාන ලාභාංශ සාමාජිකයාට ලද හැකි සේ පවත්වා ගත හැක. වැඩ කිරීම දුප්පතුන් සේම පොහොසතුන්ද එක හා සමානව සිදු කිරීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ඔවුන් වෙත ළගා කර දීමට හැකිවේ.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කුමන මත පළකලද සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවේ යෙදවීමක් සිදු නොවේ. එහෙත් අපි නිරන්තරයෙන් ක්‍රියාකළ යුත්තේ වල්බූරු නිදහස ගැන සිතමින් කල් මැරීම නොව බහුතර ප්‍රජාවගේ යහපත. දියුණුව සඳහා පිලිගත් ක්‍රමවේද නිසි ලෙස ප්‍රජාතන්ත්‍රවාදීව ස්ථාපිත වී තිබේද යන්න සොයා බලා ඊට නිසි පිළියම් යෙදීමයි. සණස සාමාජික වූ ඔබ හැම නව ආකල්ප තුලින් ඔබේ යහපතට මෙන්ම දියුණුවට යා හැකි මාවත විවෘත කර ගන්න. ඊට ඔබට ශක්තිය තුළින් ඥාණය පහළවේවා

**හේමසිරි බෙනරගම**

# 75 වසරක

## අසිරිය මෙසේ දකිමු

1943 සැප්තැම්බර් මස 01 වෙනි දින මොරටුවේ ශ්‍රී ඥාණාලෝක ස්වාමි පාදයාණන් වහන්සේ විසින් ආරම්භකරන ලද එගොඩඋයන සී.ස. සණස සමිතිය 75 වැනි සංවත්සරය සමරන්නේ ඉතා සතුටිනි. එදා මෙදා තුර කාලය දෙස බලන විට අද විශාල ප්‍රගතියක් ලබා ඇත. ඒ නියම මගපෙන්වීමක් හා අනුශාසනා ලබාදෙන වත්මන් ගරු සභාපති ශාස්ත්‍රපති පූජ්‍යපාද එගොඩඋයනේ ඥාණවිමල හිමිපාණන් වහන්සේගේ දක්ෂතාවය හේතුවෙනි. කාලය අපතේ නොහැර නියම වේලාවට පිළිවෙලට වැඩකරන උන්වහන්සේගෙන් අප සාමාජිකත්වයට ලබාගත හැකි ආදර්ශ බොහෝය. අපගේ දියුණුව උදෙසා උන්වහන්සේ විසින් ව්‍යාපෘති ගණනාවක් ඇතිකර තිබේ. වසරක් පාසා සිදුකරනු ලබන ශීල සමාදානය හා වන්දනා චාරිකාව සැමගේ මානසික සුවය සඳහා වැදගත් වේ.

| | |
|---|---|
| මසක දිරිය මසකට අප හට | දෙනවා |
| සැමට සරණ සාමාජික ණය | වනවා |
| උළෙලක පැතුම උත්සවයට අත | දෙනවා |
| සාමයෙ අරුනළුව නත්තල | සමරණවා |
| දිරියට සවිය ජීවන මග | සරුවෙනවා |
| සෙවන සහන ලොකු නිවසක් | හිමිවෙනවා |
| හෙළජන අසිරියෙන් අපි අවුරුදු | කනවා |
| අනිවාර්යයෙන් අපි ඉතිරිය වෙත | යනවා |
| ඥාණාලෝක හිමියන් ඇතිකල | ස.ණ.ස. |
| දුප්පත් අපට පිහිටක් වූවා | ස.ණ.ස. |
| නැතිබැරි අපව හැකි අය කරවූ | ස.ණ.ස. |
| සැමදා රැකදෙන්න දෙවිදුණි අපෙ | ස.ණ.ස. |

**ටෙස්ලි බැසිල්ඩා ගුණවර්ධන සාමාජිකා**

# ශ්‍රී ලංකාවේ සංචාරය කරමු අපි

## හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහිදි පහත සදහන් ස්ථානයන් විශේෂයෙන් අපගේ සිත් ඇඳ බැඳ තබාගනී.

මාගම්පුර වරාය, රන්මිණිතැන්න ටෙලි නාට්‍ය හා සිනමා ගම්මානය, සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය, යාල ජාතික වනඋද්‍යානය හා වෙරළ තීරය, සිතුල්පව්ව, කසාගල රාජමහා විහාරය, නයිගල රජමහා විහාරය, මුල්කිරිගල රජමහා විහාරය

**සටහන : එම්.රොහාන් ජේ. පෙරේරා**

# 2018 හොඳම පැමිණීම අපි



ගීත්මා ඔමන්දි



හසින්දි සමිතභාෂි



සනුක සුජයන



තිදස අත්විඳු

දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ළමා සමාජ සාමාජිකත්වය හිමි, ශ්‍රී ලංකා ළමා ආරක්ෂක අධිකාරියේ ලියාපදිංචි සහතික හිමි රිවිරැස ළමා සමාජය සී.ස. හත්බෝධිය සණස සමිතියට අනුබද්ධිත කාන්තා සමිතියේ අනුශාසකත්වය ලබයි. 2018 වර්ෂය පුරා තමන්ගේ පැමිණීම සම්පූර්ණ කල දරුවන් සිව්දෙනෙකුට ත්‍යාග වවුචර් ලබාගන්නා ලදී.

හත්බෝධිය සණස සමිතියේ හා සුබ සාධක සමිතියේ උපසභාපති ධුරය හොබවන බලයලත් මිනින්දෝරු සිංහ කේ.වී.එම්.ඩබ්. සමරණායක හා හත්බෝධිය සණස ප්‍රධාන විගණන පරීක්ෂක හා සුබසාධක සමිතියේ කාරක සභික, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් සිංහ ජගත් ජයතිලක යන මහත්වරුන් මෙම ත්‍යාග වවුචර් සඳහා තම පෞද්ගලික ධනය පරිත්‍යාග කරන ලදී.

**ටී.එස්. අමරතුංග**
**කාන්තා සමිති ලේකම්**
**හත්බෝධිය සණස**

# සණස අපි කුහුඹුවෝ වෙමු

ඉතා කුඩා නමුදු ඉතා ඥානවන්ත කෘමි සත්වයෙකු පොලොවෙහි ඇත. කුහුඹුවෝ බල නැති සමූහයක්ය. එහෙත්, ග්‍රීස්ම කාලයෙහි ඔවුහු ඔවුන්ගේ කෑම සපයා ගනිති.

කුහුඹුවා ඉදිරිපිට තබන බාධකයන් නිෂ්ඵලය. මන්ද ඔවුහු කෙසේ හෝ ඉන් රිංගා යති. නැතහොත් වෙනත් මාර්ගයකින් ගොස් ඔවුනගේ ගොදුර උසුලා ගෙන යති. නිතර වෙන්ව හා තනිව නොසිටින කුහුඹුවෝ, රංචු පිටින් පිටත්ව යති. කණ්ඩායම එකිනෙකාට ඇති ශක්තියයි. උදාසීන නොවන කඩිසර කම ඔවුනගේ බැම්මයි.

අද දවසේ මිනිසාද වෙන්වීමට, තනි වී සිටීමට, තම හිතවාදීන්ට පමණක් සීමා වීමට බාධක මැද සිරවී අලසව සිටීමට පුරුදු වී නොසිට කුහුඹුවෝ ආදර්ශය තුළින් තම ජීවිතවලට වටිනාකමක් ඇතිකර ගැනීමටත්, අනාගත ආයෝජන සඳහා වර්ධනාත්මක අඩිතාලමක් දැමීමටත් උත්සාහ දැරිය යුතුය.

**ටී.එස්. අමරතුංග**
**හත්බෝධිය සණස කාන්තා කමිටු ලේකම්**

# සිරුරට ගුණදෙන වට්ටක්කා

මේ දිනවල අපගේ වෙළඳ පොලේ බහුලව හමුවන එළවළුවකි, 'වට්ටක්කා' ශ්‍රී ලංකිය දේශගුණය අනුව ගෙඩියේ ස්වරූපය මෙන්ම රසයේ තරමක් වෙනසක්ද ඇතිවූ ශාඛය හෙයින් මන්ම කොළ දළු වශයෙන්ද ආහාරයට ගත හැක.

විශේෂයෙන් මුත්‍රා අමාරුව, උදරාබාද, අජීර්ණ මෙන්ම මල බද්ධයටද වඩා යෝග්‍යයි.

දියවැඩියාව, පණු රෝග වගේම තන්තු සහිත නිසාවෙන් ආහාර දිරවීමටද උපකාර වේ.

අර්ශස් රෝගයටද බහුලව භාවිතා වන අතර වට්ටක්කා වල කොලොස්ටරෝල් අඩංගු නොවීමද වැදගත් වේ.

ඉතා ඉහල ආයුර්වේද වටිනාකමක් ඇති වට්ටක්කා මෙතරම් වටිනා ගුණ තිබෙන බව බොහෝ දෙනෙක් නොදනි.

**එම්. රොහාන් ජේ. පෙරේරා - ප්‍රකාශන කමිටු නියෝජිත**

# සමුපකාර සමාජයක් බිහිකිරීමට නම්, සමුපකාර සාමාජිකයාගේ කාර්ය්‍ය භාරය කුමක්ද?

සමුපකාරය, සමාජ ක්‍රමයක් බවට පත් කිරීම සෑම සමුපකාර සමිතියකම/සංගමයකම පරමාර්ථය බවට පත්කර ගනිමින් අතුරු ව්‍යවස්ථාවේ පරමාර්ථය වශයෙන් නම් නොකළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් නොමැති තරම්ය.

නමුත් අතුරු ව්‍යවස්ථාවක නැතිනම් නීති කෘත්‍යයක වදනක් වශයෙන් එසේ නම් කිරීමෙන් පමණක් එකී පරමාර්ථ ගත කරුණු ඉටුවන්නේ නැත. මෙය හරියට බෞද්ධයාගේ එකම පරමාර්ථය නිවන් අවබෝධ කර ගැනීමය. එය ඉටුකර ගැනීමට බෞද්ධයා කළයුතු කාර්ය්‍ය කුමක්ද? යන්නත්, පටන්ගත යුත්තේ කොතනින්ද? යන්නත් දන්නේ නැති නම් කිසිම දිනක බෞද්ධයකුට නිවන් අවබෝධ කරගැනීමට නොහැකි වනු ඇත. (මේ ගැන වෙනම අප කථා කළ යුතුය. එහෙත් එය සරලව කියන්නේ නම් ලෝකෝත්තර චතුරාර්ය්‍ය සත්‍යය අවබෝධ කර ගැනීම බෞද්ධයා කළයුතුව ඇත.)

සමුපකාරය ගැන නැවත අප අවධානය යොමු කරන විටද කිමට ඇත්තේ කුමක්ද? ඒ සඳහා සමුපකාර චතුරාර්ය්‍ය සත්‍යය අවබෝධ කර ගැනිම සමුපකාරිකයා කළයුතුව ඇත. ඒ සඳහා ද සමුපකාරිකයා කුමක් කළ යුතුද? යන්න පමණක් නොව, කොතනින් පටන්ගත යුතුද? යන්න තේරුම් ගත යුතුව ඇත. එහිදී පිළිතුරු සොයාගත යුතු ප්‍රධාන ප්‍රශ්ණ දෙකක් ඇති බව සඳහන් කළ යුතුය. එම ප්‍රශ්ණ දෙක වන්නේ කුමක්ද? එනම්

01 සමුපකාරය යනු කුමක්ද?

02 සමුපකාර සමිතිය යනු කුමක්ද? යන ප්‍රශ්ණ දෙකට නිවැරදිව පිළිතුරු සොයා ගත යුතුය.

මෙම ප්‍රශ්ණ දෙක කෙරෙහි අවධානය යොමු කරන විට පැහැදිලිවම පෙනෙන්නට ඇති කරුණ වන්නේ මේ සඳහා එකම උත්තරයක් දීමෙන් එය නිවැරදි පිළිතුරක් නොවන බවය. අප එය එසේ කියන්නේ අප සමුපකාර සාමාජිකයා දැනුවත් කිරීමට ගිය අවස්ථාවලදී සමුපකාරය යනු කුමක්ද? කියා පැමිණි අයගෙන් ප්‍රශ්ණ කරන විට ලබාදෙන පිළිතුරු වලින් කියන්නේ සමුපකාරය යනු කුමක්ද? යන්න නොව සමුපකාරය සමිතිය යනු කුමක්ද? යන ප්‍රශ්ණයට පිළිතුර වූ නිසාය.

අප එසේ කියන්නේ වෙන කිසිවක් නිසා නොව අප සමුපකාරය යනු කුමක්ද? යන ප්‍රශ්ණය අසා එයට පිළිතුර ලබා ගත් පසු දෙවනුව අපි සමුපකාර සමිතිය යනු කුමක්ද? කියා ප්‍රශ්ණය ඇසුවිට ඊට පිළිතුරු දීමට අදිමදි කම් දක්වමින් කියා සිටින්නේ අනේ අපි සමුපකාරය යනු කුමක්ද? කියා ඇසු ප්‍රශ්ණයට දුන් පිළිතුර තමයි මෙයටත් දෙන්න වෙන්නේ කියා ඒ අය කියමින් මේ ගැන සොයා බැලීම ආරම්භ කරන නිසාය.

එම පමණක් නොව ලංකාවේ සමුපකාර සමිතියක සාමාජිකයෙකුගෙන් සමුපකාරය යනු කුමක්ද? යන ප්‍රශ්ණයත් එංගලන්තයේ සමුපකාර සමිතියක සාමාජිකයකුගෙන් සමුපකාරය යනු කුමක්ද? යන ප්‍රශ්ණය, ඇසු විට ලබාදෙන පිළිතුර අතරද වෙනස්කම් ඇති බව සඳහන් කළ යුතුව ඇත. අපඑය එසේ කියන්නේ ඇයි?

ලංකාවේ සමුපකාර සාමාජිකයා ලබාදෙන පිළිතුර වන්නේ හාල් පොතට සහල් ගැනීමට හාල් පොත් ඇති අයට රජය විසින් ආරම්භ කර ඇති වෙළඳ සැලක් බවය. නැතිනම් සහනාධාර ලබා දෙන අයට රජයේ ආයතනයක් වශයෙන් ගමේ ආරම්භ කර ඇති වෙළඳ සැලක් බව කියන පිළිතුර ලබාදෙයි. මෙයට හේතුව කුමක්ද? ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ආරම්භ වන්නේ රජයේ සහනාධාර බෙදා හැරීම අරමුණු කරගෙන වන නිසාය.

ලංකාවේ සමුපකාර සමිතියක සාමාජිකයින් වශයෙන් නොව නායකකාරාන්ධින්ගෙන්ද ලැබෙන පිළිතුර මෙයයි. සියළුම දේශපාලන ප්‍රජාවගේද අදහස වී ඇත්තේ මෙයමය. එහි අවාසනාව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිටින බොහෝ අයගේද සමුපකාර කියවීමද, මෙයට වෙනස්වී නැති තරම්ය.

නමුත් එංගලන්තයේ සමුපකාර සාමාජිකයෙකුගෙන් මෙවැනි පිළිතුරක් කිසිදිනක ලැබෙන්නේ නැත. ඒ අය කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රජාව වූ අප දේශපාලන ප්‍රජාවගේ අශිර්වාද මැද ව්‍යාපාරික ප්‍රජාව විසින් භාණ්ඩ වෙළඳාමේදී අපට සුරා කෑමට භාජනය කල නිසා එම සුරා කෑමෙන් මිදීම සඳහා සමුපකාරය අපි විසින්ම ආරම්භ කළ බවය.

එසේ නම් ලෝකයේ වෙළඳපොළ සුරා කෑම ආරම්භ විමත් සමග ඉන් පීඩනය හා සුරා කෑමට භාජනය වූ පිරිස් එක්වී එකී සුරා කෑමට හා පීඩනයට එරෙහි ආරම්භ කල සංවිධානයක් බව ඒ අයගේ කියවීම වී ඇත.

එපමණක් නොව 1917 රුසියාවේ සුරා කෑමට එරෙහිව සමාජවාදී විප්ලවය සිදුවන විට එංගලන්තයේ සුරා කෑමට එරෙහි සංවිධානය වූ සමුපකාර ව්‍යවසායකයින් එක්වී සමුපකාර පක්ෂයක් බිහිකර ගැනීම ලෝකයේ වැදගත් වෙනස්කම් දෙකක් වශයෙන් සමුපකාරිකයන් තේරුම් ගත යුතුව ඇත.

සමුපකාර ව්‍යාපාරය ලෝකයේ බිහිවන්නේ වැටුප් ශ්‍රමය භාවිතයට ගෙන වැටුප් ශ්‍රමිකයින් සුරා කෑම ආරම්භ වීමත් සමගමය. එය වැටුප් ශ්‍රමිකයා පමණක් නොව ගොවියා ධිවරයා ආයතනික සේවකයාද සුරා කෑමට භාජනය වූ නිසා ඉන් නිදහස් වීමට සමුපකාර සමිති ක්‍රමය ලෝකයේ ආරම්භ වී ඇත. එය 19 වන සිය වසේදී වීම විශේෂිතයකි.

එනම් ඊට පෙර ලෝකයේ කිසිම කිසි රටක සමුපකාර සමිති ව්‍යාපාරය නොපැවතීම තුල එය තහවුරු වන නිසාය. එහෙත් මෙහිදී තේරුම් ගත යුතු ප්‍රශ්ණයක් ඇත. එනම් වැඩවසම් සමාජ ක්‍රමයක් පැවති ලෝකයේ කිසිම රටක සමුපකාර සමිති බිහි නොවුනේ ඇයි? යන ප්‍රශ්ණය වේ. එනම් එකී සමාජයේ සුරා කෑම පැවතියේ නැද්ද? යන්න වේ. අප රටේ වුවද, මෙම ප්‍රශ්ණය ඇසිය යුතුව ඇත.

ඉතිරිය ලබන කලාපයට....

**සුරේන්ද්‍ර ඩී. බුලත්සිංහල**
**සමුපකාර ජන සමාජයක් බිහි කිරීමේ ජාතික ව්‍යාපාරයේ අධ්‍යාපන, ප්‍රහුණු හා ජනමාධ්‍ය ලේකම්**

## මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

## කියවන්න... දැනුම ලබන්න....

### දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 මැයි 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :-** **අප්‍රේල් මාසය සිංහල මාස ක්‍රමයට කුමන නමින් හදුන්වන්නේද?**

## කුපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 02**

**සී.ස. සීතාවක සණස සමිතියේ**
**පී.කේ. ලලිතා මිය**

## කුපන් අංකය 04

මුලකුරු සමග නම: ......................................................

ස්ථිර ලිපිනය: ......................................................

......................................................

දුරකථන අංකය: ......................................................

පුරුදු අත්සන: ......................................................

සණස සමිතියේ නම: ......................................................

......................................................

පිළිතුර: ......................................................

......................................................

## අනියත බව කියයි

සඳරැස් වැටුන පන්සල් බිම හැන්දෑ කෙරේ
පොල්තෙල් පහන් සුවදිනි මුළු ගමම පිරේ
බුදුබණ ඔබේ මුවින් පිටවුන නිරන්තරේ
අප සිත්තුලින් කිසිදින අමතක නොකෙරේ

ලොකු හිමියනුත් නැදෑ හිතවතුන් සැම
අතහැර දමා යන්නට ගිය කරුණ කිම
ඉපදුන සැමට මරණයමයි පොදු දහම
අප සිත් සනසා ගමු පතමින් නිවන අම

නායක හිමිට සවියක් වී ඔබ උන්නා
සැම විටකදිම හිමිසමගින් පිය මැන්නා
ඔවදන් තුලින් මනුදම් කැටිකර පෙන්නා
කා සමඟත් සිනහාමුසු මුවගින් උන්නා

සනරාමර පියා දෙසුදම් මෙනෙහි කර
සසරේ අනියත බව නිතරම පසක් කර
කතරේ ගියත් සැම භවයෙම වරින් වර
අජරාමර සතුට ලැබේවා නිවන් පුර

මාලපල්ල ශ්‍රී සුදර්ශණාරාම විහාරස්ථානයේ වැඩසිටි පූජ්‍යපාද වීරකැටියේ රක්ඛිත පොඩිහාමුදුරුවන් අපවත්වී තෙමසක් ගතවනදිනදී

**එල්.ඒ.එස්. දික්වැල්ල - ගලවිලවත්ත මාලපල්ල සණස**

# ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය

සංවර්ධිත රටක සේවා නියුක්තිය ඉහළ මට්ටමක පවතින අතර, ඌණ සංවර්ධිත හෝ සංවර්ධනය වෙමින් පවතින රටක සේවා නියුක්තිය පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවත්නා රටකි. විරැකියාව සංඛ්‍යාත්මකව වර්ධනයවී තිබුනද ඉතියෝපියාව වැනි රටවල් සමග සැසඳීමේදී නිරාහාරව මියැදෙන, දරිද්‍රතාවයෙන් පෙලෙන, ජන කොටසක් මෙරට දක්නට නැත. ස්ථිර රැකියා නොමැති පිරිස ස්වයං රැකියා වලින් හෝ විවිධ ජීවන ක්‍රම මගින් ස්වකීය අපේක්ෂා සපුරා ගනිති. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 40%ක් දිනකට ඇ.ඩො. 02 කට අඩු ආදායමක් ලබන බව වාර්තාවේ. ඒ අනුව මෙරට දුප්පත් රටකි. 2018 වසර සඳහා අළුතින් ඡන්ද දායකයෝ 231,229 ක් ලියාපදිංචි වී සිටිති. මෙවර උසස්පෙළ විභාගයට පෙනී සිටි තුන් ලක්ෂ විසිඑක් දහස් ගනනකින් විශ්ව විද්‍යාලයට සුදුසුකම් නොලැබූ පිරිස 153,562කි. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉවත්වන පිරිස සහ පාසැල් හැරයන සංඛ්‍යාව එකතු වූ විට රැකියා වෙළඳ පොල සඳහා ඇති ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහළ යයි. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණයට අනුව රටේ සමස්ත ශ්‍රම බලකාය ලක්ෂ 83කි. ජන ගහනයෙන් පහළොවකින් එක් අයෙකුට රැකියා සපයා ඇති බව රජය පෙන්වා දෙයි. වර්ෂ 2020 වන විට සියළුම රජයේ සේවකයන්ගේ මූලික අවම වැටුප රු10,000 කරන බවට ප්‍රතිඥා දෙයි. වැටුප් වැඩිකිරීම සාර්ථක වන්නේ එහි මූර්ත අගය වැඩිකිරීමෙන් මිස සංඛ්‍යාත්මක වර්ධනයකින් නොවේ. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමෙන් වැටුප් වැඩිකිරීම යනු ආර්ථික උද්ධමනයක් ඇති කිරීමකි.

ත්‍රිවිධ හමුදාව හැර රාජ්‍ය සේවකයෝ ලක්ෂ 11 ක් වෙති. මොවුන්ගෙන් ජාතික ආදායමට ලැබෙන සම්පත් දායකත්වය ගනන් බලා නැත. රාජ්‍ය සේවයට එල්ලවන පොදු චෝදනාව එහි පවතින අකාර්යක්ෂමතාවයයි. වැඩිම රාජ්‍ය සේවකයන් සිටින රටක් වශයෙන් ලංකාව සැලකේ. අවුරුදු 40ට වැඩි ශ්‍රමික සංඛ්‍යාව 59.8% කි. ජව සම්පන්න ශ්‍රමිකයන් අවුරුදු 20-අවුරුදු 29 දක්වා පිරිස 15.4%කි. අවාසනාවන්ත තත්වයකි. විශ්‍රාම වැටුප්, වැඩිහිටි දීමනා, සමෘද්ධි දීමනා, විවිධ ආපදා සඳහා වූ සහනාධාර, රැකියා ප්‍රවර්ධන සඳහා රජයට වැයකිරීමට සිදුවන මුදල් සම්භාරයට තර්ජනයක්ව පවතී. පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය ලක්ෂ 25කි. ඉහළ තනතුරු සඳහා වැඩි වැටුප් සහ සේවා පහසුකම් සැලසෙයි. රජයේ උපාධි ගුරුවරුන්ට බාලාංශ පංතිවල පවා ඉගැන්වීමට සිදුවී තිබේ. දශක කිහිපයකට පෙර රජයේ රැකියා ගැසට් පත්‍රයේ පලකරන ලදී. තරඟ විභාග වලින් සුදුස්සන් තෝරා ගන්නා ලදී. කම්කරු හා සමාන ශ්‍රේණි සඳහා රැකී රක්ෂා කාර්යාලයේ ලියාපදිංචි වීමෙන් තෝරා ගන්නා ලදී. වරින් වර දේශපාලකයන්ගේ මැදිහත්වීම නිසා රැකියා ලබාදීම අවුල් සහගතවී තිබේ. මැතිවරණයකින් පසු සේවක සංඛ්‍යාවක් ඉවත් කිරීම, අළුතින් සේවක සංඛ්‍යාවක් පත්වීම සුලභ දර්ශනයකි. බොහෝ විට මෙම තත්වය රාජ්‍ය සංස්ථාවල සිදුවේ. ජාත්‍යන්තර පාඨශාල සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන වලින් පිටවන පිරිස විදේශ රැකියා වලට යොමුවීම දක්නට ලැබේ. මෙරට රැකියා හැර දමා විදේශගත වීම, පදිංචියට යාම නිසා රටට සිදුවන හානිය සුළු පටුනොවේ. බුද්ධි ගලනය නවතා විශේෂඥ දැනුම රටේ රඳවා ගැනීමට රජය විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුවේ.

නිසි අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීමට නොහැකි තරුණ පිරිස් ත්‍රීරෝද රථ රැකියාව තෝරා ගනිති. ශ්‍රම බලකායේ සෑම 9 දෙනෙකුටම එක් අයෙක් ත්‍රී රෝද රථ පදවන්නෙකි. රියදුරෙකු පැය දෙකක සේවා කාලයක් සඳහා පැය හයක කාලයක් රැඳී සිටිය යුතුවේ. 1950 රට තුල ලියාපදිංචි වාහන 50,000 කි. අද වන විට ලක්ෂ 75 ඉක්මවා තිබේ. ඉන්ධන පිරිවැය සම්පූර්ණයෙන් විදේශ විනිමය පිටතට ගලායාමකි. ශ්‍රී ලංකන් එයාර් ලයින් සතු ගුවන් යානා විසිගනනකි. එහි සේවක සංඛ්‍යාව හත් දහස ඉක්මවයි. ලක්ෂ ගනනින් වැටුප් ලබන ඉහළ පංතියේ තනතුරු දරන්නේ සුදුසුකම් සපුරා නැති දේශපාලඥයින්ගේ හිතවතුන් සහ නෑදෑයින්ය. මෙම ජාතික ව්‍යසනයට පාලකයන් වගකිව යුතුවේ. අද වන විට විදේශ විනිමය උපයන ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස මැද පෙරදිග ගෘහ සේවයට යාම සඳහන්වේ. 2016 දී විදේශ රැකියා සඳහා 24,493ක් පිටව ගොස් තිබේ. 2018 දී 19 දෙනෙකු අතුරුදහන්ව තිබේ. 225ක් මියගොස් ඇත. ඉන් 31 දෙනෙකු සියදිවි නසා ගැනීම්ය. මොවුන්ගේ පවුල් ජීවිත අන්ත අසරණය. බොහෝ පියවරු මත්ද්‍රව්‍යට ඇබ්බැහි වී සිටිති. ඔවුන් අතින් දරුවන්ගේ ජීවිත විනාශවී යයි. සුළු ආර්ථික වාසි සොයා යාමෙන් පවුල් සංස්ථා විනාශ වී යාම වැලැක්වීමට විදේශ තානාපති සේවය, විදේශ සේවා කාර්යාංශයේ මැදිහත්වීම අත්‍යාවශ්‍යය.

කම්කරු ශ්‍රේණියේ රැකියා බොහෝ විට ක්‍රියාත්මක වන්නේ අනියම් පදනමකිනි. තේ වතු කම්කරුවන් දෛනික වැටුප රු1000ක් ඉල්ලා වර්ජනය කරන ලදී. සේව්‍ය පක්ෂය නිෂ්පාදන පිරිවැය මත ගෙවීමට නොහැකි බව ප්‍රකාශ කරන ලදී. බොහෝ වතු කම්කරුවෝ රැකියාවන් සොයා නගරයට සංක්‍රමණය වෙති. දෛනික රු 1200 හෝ ඉහල වැටුපක් ලබාගනී මේ අතර ඉන්දීය කම්කරුවන් ගොවිතැන ඇතුළු රැකියාවල නියුක්තව සිටී. සංචාරක වීසා මත ලංකාවේ රැඳී සිටිති. එය රැකියා ප්‍රශ්නයට පමණක් නොව සමාජ ප්‍රශ්නයක් බවටද පත්විය හැක. සැඟවුන සේවා නියුක්තිය හෙවත් බදු ගෙවීමකින් තොර විවිධ ජාවාරම් වල නියුක්ත පිරිසක් සිටී. මොවුන් අතර කුඩු ජාවාරම්කරුවන්, මත්ද්‍රව්‍ය ප්‍රවාහකයන්, පාතාලයේ මිනීමැරුම් මංකොල්ල කෑම් සිදුකරනන්, මෙන්ම ගණිකා මඩම් පවත්වන පිරිසක්ද වෙති. සමස්ථයක් ලෙස සලකන විට ජීවන වෘත්තිය සඳහා හොඳ නරක භේදයකින් තොරව මුදල් රැස්කිරීම බොහෝ දෙනෙකුගේ බලාපොරොත්තුවයි.

**යූ.ඩී.එස්. වීරසිංහ**
**නැ. ඇරැව්වල අංක 2 භාණ්ඩාගාරික, පර්ෂද ලේකම්**

# කාන්තා හඬට කන් දෙමු

අප අවට සමාජය දෙස ඕනෑකමින් බැලුවොත් කාන්තාවනට වන අතවර, හිරිහැර, කොතරම්ද කියා පෙනේ. සෑම කාන්තා දිනයකදීම ඔවුන්ට සම තැන දියයුතු යැයි කථා කලද එය ලැබෙනවාදැයි සිතා බැලිය යුතුය.

සැබැවින්ම තොටිල්ල පදවන අත ලොවම පාලනය කෙරේ යැයි කියමනක් තිබුනද ලොව පාලනයට කලින් තම නිවස තුලින් පටන් ගන්නා පාලනය ලොවම මවිත කරවයි. තමාගේ ඇඳුම පැලඳුම රූප ශෝභාව ගැන නොසිතා දරුවන් වෙනුවෙන් කාලය කැපකොට ස්වාමියාටත් රුකුලක් වෙමින් ස්වයංරැකියාවල නියුතු වන කාන්තාවන් අද අප රටේ කොතෙකුත් ඇත. එවන් කාන්තාව දිරිය කාන්තාවකි. සමිති සමාගම්, රැකියා ස්ථාන, කාර්මාන්තශාලා යන තැන්හි ඉදිරියෙන්ම සිටින්නේ කාන්තාවයි. තැන නොතැන නොබලා වැඩ කරයි.

ඉතිං මේ අයට කොපමණ ගරු කල යුතු දැයි නොවැටහේද? මේ ඔවුන්ගේ බිඳක් පමණි. එසේම අමතක කරන්න එපා, මේ වනවිට අපේ රටේ ජනගහනයෙන් වැඩි පිරිස කාන්තාවන් බව

**සන්ධ්‍යා ජයකොඩි**
**පිටිපන නගර සණස**

## ජාතක කතා පොතෙන්
# සාලුක ජාතකය

බරණැස් නැවර බඹදත් රජු පාලනයේ
බෝසත් ඉපිද එනුවර විදු ගව කුලයේ
එක්සත් කමින් තම සොහොයුරෙකුත් බිලියේ
මනුසත් සේවයේ යෙදුනා නැත වැලියේ

ගවයෙකු වුවත් මහ ලෝහිත වැඩිමලු වී
හීලෑ වෙමින් චුල්ල ලෝහිත හා එක්වී
එක නිවසක මෙසේ කල් හරිමින් තුටුවී
සිටියත් කුහුල් සිත, ඌරෙකු දැක ඇතිවී

කැඳබත් ආදියෙන් පෝෂණ වෙන ඌරා
දැකුමෙන් චුල්ල කණසලු වී සිත පීරා
කිසිවක් නොකර ගෙයි වැද කන මේ ඌරා
දර දිය අදින අප කුෂ හැකිලෙයි සුරා

මලනුව සැලෙනු ඇයි, නොදැනද කම්පාවෙන්
පෝෂණ වෙමින් වැඩෙනා ඌරා ජීවෙන්
මංගල සාදයක් ලඟ දිනකයි, රාවෙන්
මරණය අත ලඟයි ඌරා නැත සොවෙන්

බොල් මුසු රෙඩු කෑම ගුණ දෙයි ජීවයට
එය කරුණක්ය, දිගායුෂ ලැබීමට
සංතර්පනය වන අහරින් රැකීමට
නැත අවසරය, ඌරා යයි මරණයට

සනසන මහා ලෝහිත තම සොහොයුරුවන්
බෝසත් ගුණය පාමින් ලෙන්ගතු සුරුවන්
රැවටෙනු එපා සැප බෝජන ගෙන මරුවන්
දැකුමට නොයනු සිහිපත් කර තොල් බරුවන්

*උපදේශය: විපතට කරුණු වූ ප්‍රණීත භෝජනයට වඩා*
*සැපතට කරුණු වූ නිසරු ආහාර හොඳයි* -සිරි-

# සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


ගීතා චාන්දනී


ප්‍රේමා ජයසූරිය


පී.එච්. සීලවති


කාන්ති පෙරේරා


ආර්. බාලසූරිය


චිත්‍රා කුමුදුනි


ඒ. විජේසේකර


එස්. කුමුදුනි


එන්. ඉන්දුශ්‍රියා


වී. ප්‍රනාන්දු


ශාන්තා ප්‍රනාන්දු


එන්. කෞෂලකා


සී. ප්‍රිශාන්ති


එස්. දමයන්ති


සී. දමයන්ති


රොමේෂ් ශාරක

# 37 වන සංවත්සර මහ සභාව





සී.ස. කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ 37 වන සංවත්සරය, 2019.03.24 දින ඩැනිසන් වීරසූරිය දේශන ශාලාවේදී පවත්වන ලදී.

# 28 වන ගමන් මග පසු කල නෑ. ඉදිබැද්ද සණස

පිබිදීම, නැගිටීම, වැටීම, උත්සාහය, යලිහිස එසවීම, සාර්ථකත්වය යන සියළු හැල හැප්පීම් මැද නෑ. ඉදිබැද්ද සණස සමිතිය 28වන සංවත්සරය පසු ගිය 2018.09.19 වන සදුදා දින සමිතියේ රැස්වීම් ශාලාවේදී සිදු කරන ලදී.

එහිදි අධිෂ්ඨානයෙන් පෙරමුන කරා ගිය ගමනේ විශාල ශක්තියක් බවට පත්වූ ගරු සභාපති ඩබ්. දර්ශණ දේශප්‍රිය ප්‍රනාන්දු මැතිතුමාගේ, කාරක සභික නිලධාරීන්ගේ හා අනු කමිටු නිලධාරීන්ගේ වගකීමත් කලමණාකාරීත්වයේ විශ්වාසයත් සමිතියේ අභිමාණය ලෙස සැලකිය හැකිය.

එක් එක් කාරක සභික නිලධාරීන්හට අනු කමිටු නියෝජනයන් පවරා ඒ තුලින් සමිතිය අනු කමිටු තුල කෙරෙන්නා සියළු වැඩසටහන් වල දැනුවත් භාවය ලබාගන්නා අතර ඔවුන් හට මග පෙන්වීම ප්‍රධාන කාරකසභාව සිදුකරයි.

පසුගිය වසර තුල සමිතිය ලබාගත් ජයග්‍රහණයන් අතර කාර්‍යඵල ඇගයීමේදි සමිතිය බී කාණ්ඩයේ සමිතියක් ලෙස පත් වීමත් 2017 වසරේ කල්පසු ණය ප්‍රමාණය 18.29% ක් වූ අතර එය මෙම වසරේ 9.76% දක්වා අඩු වීමත් පෙන්වා දිය හැකිය. පෙර වසරවල මෙන්ම මෙම වසරේදීත් සමිතිය මගින් වැඩිම ළමා තැන්පතු, 5වසර ශිෂ්‍යත්ව ජයග්‍රහණ, හොඳම පැමිණීම, හොඳම ගණුදෙනු, වැඩිම අනිවාර්ය තැන්පතු, කමිටු නියෝජනය ආදි අංශ ගනනාවකින් සාමාජිකයින් හට ත්‍යාග ප්‍රධානය කල අතර කමිටුවක් ලෙස ත්‍යාග ලබා ගන්නා කාරකයින් හට කාන්තා කමිටුව, විගණන කමිටුව, තරුණ කමිටුව යන අනු කමිටු මගින් එම සාමාජිකයින්ගේ පුද්ගලික වියදමින් සමරු හා තිළිණ පිරිනැමීම සිදු කරන ලදී.

01 පිටුවෙන් ....

## 30 වන සංවත්සරය...

භාණ්ඩාගාරික ශ්‍රාස්ත්‍රවේදී නීතා කරවිට මහත්මිය අදහස් දක්වමින් අවු 30 ක කාලයක් භාණ්ඩාගාරික ධුරයේ කටයුතු කරමින් සමිතිය ආරම්භයේ සිට මේ දක්වා සංවර්ධනය වු අයුරු පැහැදිලි කරන ලදී. 2018 වර්ෂයේ කෝටි 05 ක වත්කම් උපයා ඇති අතර, ශුද්ධ ලාභය ලක්ෂ 13ක් බව අවසාන වශයෙන් දන්වන ලදී.

මෙම අවස්ථාවට සණස සංවර්ධන බැංකු ප්‍රධාන කළමණාකාරිනිය ඇතුලු බැංකු නිලධාරිතුමාද, හෝමාගම කලාපයේ කළමණාකාරිනියද, හෝමාගම පර්ෂද ලේකම්තුමියද, හෝමාගම කාන්තා කමිටු නායිකා ප්‍රේමලතා වනිගසේකර මියද, සී.ස. හිරිපිටිය නියඳගල සණස සමිතියේ සභාපති ඇතුළු කාර්‍ය මණ්ඩලයද, සී.ස. ගලවිලවත්ත උතුර සභාපතිතුමා වෙනුවට කාරක සභිකාවන්ද, ගලවිලවත්ත ග්‍රාම නිලධාරිතුමියද සහභාගි වූහ.

දුවා දරුවන්ගේ නර්තන, විරිදු ගායනා හා වැඩිහිටි ගායනා වලින් අලංකාර වු සංවත්සර සභාව සහභාගි වු සියලු දෙනාට දිවා ආහාරය හා ත්‍යාග ලබාදීමෙන් පසු අවසන් වන ලදී.

2019 වසර සදහා පත්වු නිලධාරි
මහත්ම මහත්මීහු

| | |
|---|---|
| **ගරු සභාපති** | : සා.වි. ධර්මවේදී එම්.ඩී. ජිනදාස |
| **ගරු උපසභාපති** | : සා.වි. ඩබ්.ඒ.එල්. සේනාරත්න |
| **ගරු ලේකම්** | : සා.වි. ඒ.එස්. කුසුමපාල |
| **ගරු භාණ්ඩාගාරික** | : සා.වි. නීතා කරවිට |
| **ගරු කාරකසභික** | : ඒ. රණසිංහ |
| **ගරු කාරකසභික** | : ඉරාන් කරඳවත්ත |
| **ගරු කාරකසභික** | : ටි.කේ.එන්. ධම්මිකා |
| **ගරු කාරකසභික** | : රසිකා රත්නායක |
| **ගරු කාරකසභික** | : කල්‍යාණි ප්‍රීතිලතා |

**වාර්තාව - එම්.ඩී. ජිනදාස, මහකටුවාන ගලවිලවත්ත සභාපති**

# ණය ගත්තෝ අද සැනසෙන්නෝ ණය ගත්තෝ හෙට වැනසෙන්නෝ



මේ දවස්වල ඔබේ හිතේ පැලපදියම් වෙලා තිබෙන දෙයක් ගැන මම කියන්නද? සිංහල අළුත් අවුරුද්ද අතලගම නිසා සණස බැංකුව පැත්ත නොගිය අයත් මේ දවස්වල අළුත් සාමාජිකත්ව අයදුම් පත්‍ර අරගෙනම යනවා. කළමණාකාරතුමියත් සුපුරුදු සිනහමුසු මුහුනින්, කාරුණික වදනින් ඔබ පිළිගනිමි. ඔබේ ගමේ බැංකුව, ළඟම බැංකුව ඔබේ සාමාජිකත්ව මුදලෙන් යැපෙන බැංකුව. හදිසියකදී කාටත් පිහිටවෙන පයින් යන දුරක තිබෙන බැංකුව අවශ්‍යතාවයන් රැසක්ම ඉක්මනින් එකම තැනකින් ඉටුකරන බැංකුව ඒ වුනත්....

ණය ගැනීම ගැන බුද්ධ දේශනයේ ඉන සූත්‍රයේ දැක්වෙන්නේ හැකි තරම් ණය නොවී ඉන්න බලන්න කියායි. ඒ නමුත් හදිසි අවශ්‍යතාවයක් එසේ කලින් දැනුම් නොදී එන අවස්ථා බොහොමයි. සිංහල අවුරුද්ද එනවිට අප කොයිතරම් මුදලක් නිරපරාදේ වියදම් කරනවාද? අල්මාරියේ තිබෙන තවමත් පාවිච්චියට නොගෙන ගිය අවුරුද්දේ ගෙන ආ ඇඳුම් කොපමන තිබෙනවාද? මේ වසරේදීමත් එම දේවල් ප්‍රයෝජනයට ගන්නට හැකි වුනොත් කොයි තරම් මුදලක් ඉතිරි වනවාද?

මම ණයට ගන්නට බලාපොරොත්තු මුදල් ප්‍රමාණය අඩුකරලන්නටත්, එම අඩුකල ප්‍රමාණය වෙනත් කටයුත්තකට යොදවන්නටත් මේ නිසා ලැබෙන මහඟු වාසියකි. ණයක් ගතහොත් එය ඉක්මනින් ගෙවා දැමීම ඔබගේ යුතුකමක් කළ ගුණ දන්නා ඔබගේ කාර්යයක්

**ඔබ ණයක් ගන්නට අදහස් කරනවා නම් මේ ගැනත් සිතන්න**

- බැංකු තිබෙන තරමට ණය ගන්න හිතන්න එපා
- අවශ්‍යතාවයන් සහ ආශාවන්ගේ අසීමිත භාවය ගැන සිතන්න
- තරඟය සහ තන්හාව මගහරින්න
- ඇඟිල්ලේ තරම ගැන කටයුතු කරන්න.
- ලද දෙයින් සතුටුවන්න.

*ලබන අවුරුද්ද ඔබට සුබවාදී වසරක් වේවි.*

**ලක්සමන් ගුණවර්ධන - පිටිපන නගරය සණස**

## සහෝදරත්වය, සුහදත්වය, හා විනෝදය සපිරි චාරිකාව

2018.11.04 දින උදැසන 5.30 ට පමණ සණස සමිතිය අසලින් මාතර දක්වා යන චාරිකාවේ ගමන් ආරම්භය සිදු වු අතර ඒ සදහා සාමාජිකයින් 90ක් පමණ සහභාගි විය. ගමනේ සංවිධාන කටයුතු තරුණ කමිටුවේ මුලිකත්වයෙන් සිදුවින.

ප්‍රථමයෙන් අළුත්නුවර කන්දෙ විහාරය වැද පුදා ගත් සාමාජිකයින් ඒ අතර මගදි උදෑසන ආහාරය ගන්නා ලදී.

අනතුරුව වෙහෙරහේන සිද්ධස්ථානය වන්දනා කොට එහිදීම දිවා ආහාරය ගෙන මාතර මුහුදු තීරය වෙත ලගා විණි.

මාතර මුහුදු තීරයේදී සාමාජිකයන් විනෝදකාමි වැඩසටහන් කිහිපයකට සහභාගි විය. එම විශේෂාංග සුහදශීලීව ඉතාමත් විනෝදකාමීව සාමාජිකයින්ගේ හැකියාවන් අතිශය ලෙස පිලිඹිබු කල අවස්ථාවක් විය.

අතර මගදී සාමාජිකාවන් දෙදෙනෙකු ගේ ඥාති නිවසකින් ලබාදුන් තේ පැන් සංග්‍රහය මෙහිදි විශේෂයෙන් සිහිපත් කල යුතු අතර ගමන් වියදම, දිවා ආහාරය, සවස තේ පානය සමිතිය මගින් ලබාදෙන ලදී.

## තරුණ කමිටුව මගින් පැවැත්වූ ධර්ම දේශානා පිංකම

තරුණ කමිටුවේ මෙහෙයවීමෙන් ධර්ම දේශනා පිංකම සමිති රැස්වීම් ශාලාවේදි පවත්වනු ලැබීය.

සමිතිය සදහා ඉදිකිරීමට යෝජිත නව දෙමහල් ගොඩනැගිල්ල සදහා ආශිර්වාද පතා හා මියගිය සාමාජිකයින් හට පිං පැමිණවීමත් සාමාජික සියළු දෙනා හා ග්‍රාමවාසී සියළු දෙනාට සෙත් ප්‍රාර්ථනා කිරීම මෙම පිංකමේ අරමුණ විය.

දේශකයාණන් වහන්සේ ලෙස අතිපූජ්‍ය වල්පොල ගෝනම ස්වාමීන් වහන්සේ වැඩම කල අතර ආශාව, හා අත්හැරීමේ ගුණයේ ඇති වටිනාකම පිළිබදව උන් වහන්සේ විසින් කාලීන ධර්ම දේශනයක් සිදුකරන ලදී.

08 පිටුවට.....

**කේ.ජී.ඩී. මුදිතා ප්‍රියදර්ශනි - වාර්තාකාරිනි**

## 28 වන ගමන් මග පසු කල

# නැ. ඉදිබැද්ද සණස




**ගරු සභාපති** : ඩබ්. දර්ශන දේශප්‍රිය ප්‍රනාන්දු මයා
**ගරු උපසභාපති** : ටී. දමිත් පාලිත ප්‍රනාන්දු මයා
**ගරු භාණ්ඩාගාරික** : ගයනි ඉරෝශමාලි ඩයස් මිය
**ගරු ලේකම්** : සෙව්වන්ති ප්‍රියශාන්ති මිය
**කාරක සභික** : රංග අපෝන්සු මයා, සුදේශ් වසන්ත මයා, ජනිතා කුමුදුනි මිය




**ගරු සභාපති** : කුමුදුනි නිරෝශා මිය
**ගරු ලේකම්** : චමරි රුක්මාලි මිය
නිර්මලා මල්කාන්ති මිය, ඒ.පී. හේමරංසි මිය, නීටා ඩයස් මිය, ප්‍රියංගිකා අරුණමාලි මිය




ප්‍රියංගිකා මංචනායක මිය, තිළිණි ඔමේශා මිය, උදේශිකා සංජීවනී මිය, ඡයාරූපයේ නැති - කුමුදු ප්‍රියංගනී මිය, නිලුකා සංජීවනි මිය




**ගරු සභාපතිනි** : දිමුතු කුමාරි මිය
**ගරු උපසභාපතිනිය** : ජොසපින් පෙරේරා මිය
**ගරු භාණ්ඩාගාරික** : චිත්‍රා කාන්ති මිය
**ගරු ලේකම්** : දිමුතු සදමාලි මිය
ඉශාරා මදුමාලි මිය, රීටා කාන්ති මිය, මල්කා සජීවනි මිය, ශ්‍රියානි පිරිස් මිය




**ගරු සභාපති :**
රිද්මි අසංජලි මෙනෙවිය
**ගරු ලේකම් :**
ජයනි සුජීවා මිය
**ගරු භාණ්ඩාගාරික :**
සමාධි කෞෂල්‍යා මෙනෙවිය
ඉෂාන් කුමාර මයා
සුරත්ත සංජීව මයා
ශක්ති ප්‍රබෝධ මයා
උපේක්ෂා සදරුවනි මෙ.වි.
සංජානි ප්‍රියදර්ශනි මිය
චාමර ප්‍රියදර්ශන මයා
අචිනි ගයාත්‍රි මෙනෙවිය

**කාරක සභා නියෝජිත :**
දමිත් පාලිත මයා




**ගරු සභාපති :**
නිශාන්ත පුෂ්පකුමාර මයා
**ගරු ලේකම් :**
ගයාත්‍රි උජිතා මිය
**ගරු භාණ්ඩාගාරික :**
ශ්‍රියානි රත්නසීලි මිය
සෙල්වින් ජේසන් මයා, ලතා චාන්දනී මිය, සේනක පීරිස් මයා, ලලිත් ප්‍රනාන්දු මයා, රසිකා සුමේදනි මිය, අනුලාවති මිය, ශිරානි චාන්දනී මිය, ජගත් චන්දන.



ළමා සමිතියේ දූ දරුවන්




**ප්‍රධාන කළමණාකාරිනී :**
ශ්‍යාමලි විදුශිකා
**සහය කළමණාකාරිනි :**
ප්‍රශානි ලක්ෂනා, සුගන්ධි චතුරානි



විනෝද චාරිකාව - අලුත්ගම කන්දෙ විහාරයේදී




ශිෂ්‍යත්ව ජයග්‍රහන ලැබූ ළමා සමිතියේ දරුවන්



තරුණ කමිටු ධර්ම දේශණය